ඒ අනුව සිතක් නියෝජිතයකු ලෙසද උපකරණයක් ලෙසද ක්‍රියාවක් ලෙසද සලකා විස්තර කල හැකිය.

- ආරම්මණං චින්තේතී ති චිත්තං - අරමුණු සිතන්නේ නුයි සිත නම්වේ.
- ඒතේන චින්තේතී ති චිත්තං - එයින් අරමුණු සිතන්නේනුයි සිත නම්වේ. එනම්- සම්ප්‍රයුක්ත චෛතසික ධර්ම උපකාරයෙන් සිතනවා යන අර්ථයි.
- චින්තන මත්තං චිත්තං - හුදෙක් සිතීමම කරන්නේ නුයි සිතනම් වේ. අරමුණු ගැන සිතනවා විනා අන්කිසිවක් නොකරන්නේය යන අර්ථයි අරමුණු සිතීමත් දැනගැනීමත් හැර සිතින් කරන අන් දෙයක් නැත. එනිසා සිත ආත්මයක් හෝ ස්ථිර දෙයක් නොවේ. ඇතිවෙමින් නැතිවෙමින් යන ක්‍රියාදාමයක් පමණි. ශරීරයෙන් ශරීරයට හෝ ජීවිතයෙන් ජීවිතයට ගමන් කරන්නක්ද නොවේ. අනිත්‍ය වන සංස්ඛාර ධර්මයකි.

පරමාර්ථ ධර්මයක් හරියාකාරව හඳුනාගැනීමට උපයෝගී කරන්නා කරුණු 4කි.

1. ලක්ෂණ - එහි ස්වභාවය 2. රස - ක්‍රියාව 3. පච්චුපට්ටාන - දකින්නට තේරුම් ගන්නට එය ඉදිරිපත්වන ආකාරය 4. පදට්ඨාන - එය ඇතිවීමට හේතුවන ප්‍රධාන කාරණය. ඒ අනුව සිතෙහි ලක්ෂණාදිය මෙසේය.

- ලක්ෂණ - අරමුණු සිතීම සහ දැනගැනීම (ආරම්මණං චින්තේතී/විජානානාති) * රසය - සියල්ලටම මූලිකවීම (පුබ්බංගම රසා)
- පච්චුපට්ඨාන - එක්වසිටීම (සන්ධානය) * පදට්ඨානය - නාම සහ රූප එනම් චෛතසික සහ රූප ධර්මයන්ගේ ද සබඳතාව ඇතිබව සිත හටගැනීමට අවශ්‍ය කරුනකි.

සිත යනු එකක් නොව සමූහයකි. ගණණ් වශනේ 89 ක්සහ 121 ලෙස තථාගතයන් වහන්සේ දක්වා ඇත. එයද ක්ෂණ ලෙස ගත්විට තවත් විස්තර වෙයි. යමෙක් හෝ යමක් හඳුනාගැනීමට උපකාරීවන කරුණු කිහිපයකි. * ජීවත්වන ප්‍රදේශය * ඇසුරු කරණ තැන් * චරිත ලක්ෂණ * රැකියාව
සිත පිළිබඳවද දැනගැනීම පිණිස මේ කරුණු උපයෝගී කර ගනිමු.

| සිත | | | | | | |
|---|---|---|---|---|---|---|
| භූමි භේදයෙන් (පවතින තැන අනුව) | | | | ඇසුර අනුව | ක්‍රියාව අනුව | ස්වරූපය සහ ලක්ෂණ අනුව |
| කාමාවචර<br>54 | රූපාවචර<br>15 | අරූපාවචර<br>12 | ලෝකෝත්තර<br>8(40) | චක්ඛු විඤ්ඤාණ/සෝතවිඤ්ඤාණ<br>ඝාන විඤ්ඤාණ/ජිව්හාවිඤ්ඤාණ<br>කාය විඤ්ඤාණ/මනෝවිඤ්ඤාණ<br>යනාදී වශයෙන් | ප්‍රතිසන්ධි/භවාංග/චුති<br>දස්සන/සවන/ඝායන/සායන<br>සංතීරණ/සම්පටිච්ඡන<br>වොත්ථපන/ජවන/තදාලම්බන<br>(අර්ථ පසුව විස්තර වේ) | කුසල/අකුසල/විපාක/ක්‍රියා<br>ලෝභ/ද්වේෂ/මෝහ |